කාව්‍ය ශාස්ත්‍රය ගැන කිසිවක් නොදන්නා බව ප්‍රත්‍යක්ෂය. ලංකාවෙහි නොයෙක් විට කවි, සිලෝ බඳිමින් අපිත් පණ්ඩිතයෝ වම්හයි පැළඹෙන්නාවූ අයවලුන් විසින් ද මෙය සිතට ගනු ලැබේ නම් මැනවි"

(ගුත්තිල කාව්‍ය වර්ණනා - පිට 53)

සිංහල සාහිත්‍ය විචාරය අතින් විපර්යාසයක් ඇති වූයේ මුනිදස කුමාරණතුංග මහතාගෙන් පසුව යි සිතේ. සාහිත්‍ය රසාස්වාදය හා විචාරය සඳහා අලංකාරවාදය පදනම් කරගත් අවධිය ඉන් හමාර වූයේය.

### පාදක සටහන්

1. සීගිරි ගී ගැන කරුණු දක්වීමේ දී ආචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ Sigiri Grafiti vol. i & ii (1956) යන ග්‍රන්ථය අපට බෙහෙවින් උපකාර විය.

# 61

## I අග්බෝ රජ දවස විසූ දෙළොස් මහා කවීහු

*විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඔලිවර් අබේනායක*

පළමු අග්බෝ සමය සිංහල සාහිත්‍යාභිලාෂීන්ගේ විශේෂ අවධානයට පාත්‍ර විය යුතු කාල පරිච්ඡේදයකි. අනුරපුර යුගයේ දී දියුණු සිංහල සාහිත්‍යයක් තිබුණු බවට මේ කාල පරිච්ඡේදය නිදසුන් විසින් ගෙනහැර පානු පෙනේ. මෙ සමයෙහි දෙළොස් මහා කවි කෙනෙකුන් වූ බව ඉතා ප්‍රකට කරුණකි. මේ ලිපියෙන් අප අදහස් කරන්නේ දෙළොස් මහා කවීන් පිළිබඳ ඇති එම පුරාවෘත්තය ගැන විමසුමක් ඉදිරිපත් කිරීමටය.

මේ දෙළොස් මහාකවීන් පිළිබඳ කිසිදු සඳහනක් **මහාවංසයේ** දක්නට නොලැබීම විශේෂයෙන් සැලකිල්ලට ගත යුතු කරුණකි. දෙළොස් මහා කවීන්ගේ නාමාවලිය දක්නට ලැබෙන්නේ පශ්චාත්කාලීන සිංහල ලේඛනවලය. **පූජාවලිය**, **දළදා සිරිත**, **නිකාය සංග්‍රහය**, **සද්ධර්මරත්නාකරය** සහ **රාජාවලිය** යන ග්‍රන්ථ මේ සම්බන්ධයෙන් අපේ විමසුමට ලක්විය යුතුය. මේ පුරාවෘත්තය පිළිබඳ දැනට විද්‍යමාන මූලාශ්‍රය ග්‍රන්ථ ඒවා බැවිනි.

ප්‍රථමයෙන් ඉහත දක්වූ ග්‍රන්ථයන්හි දක්නට ලැබෙන දෙළොස් මහා කවීන්ගේ නාමාවලිය දක්වෙන සටහන් මෙහිදී උපුටා දක්විය යුතුව තිබේ. පසුව ඉදිරිපත් වෙන විස්තරයේ නිරාකූලතාව සඳහා එය අතිශයින් අවශ්‍යය.

"ඔහු මරා මාන රජහු බැන, අග්බෝ මහරජ කුරුඳු වැව බඳවා මානාරද පිරිවෙන කරවා සූතිස් අවුරුද්දක් රාජ්‍යය කළේය. ඔහු දවස දැමි මහ තෙරහු සුතන් දැ වදළහයි දත යුතු. දැමි, තෙලේ, බැබිරියෝ, දළනුරක්, දළගොත්, පුරවඩු, දලසල කුමර, කිත්ගිරි, කසුබ්, කොට, ඇපා යන මේ දෙළොස් මහා කවීහු මෙම රජු දවස විසූහ" (**පූජාවලිය**, 730 පිට. බෙන්තර සද්ධාතිස්ස සංස්කරණය)

"මානා රන් පිරිවෙන කරවූ අග්බෝ යැ-ඔහු දවස දැමි යැ සක්දමලයැ, අසක්දමලයැ, මාලාබඳබිරියැ, දළ බිසෝ යැ, අනුරුත් කුමරුයැ, දළගොත් කුමරුයැ, දලසල කුමරුයැ, කිත්සිරි කුමරුයැ, පුරවඩු කුමරුයැ, සූයයී බාහු යැ, කසුප් තොට ඇපායැ යන මේ දෙළොස් මහා කවීහු පහළ වූහ" (**දළදා සිරිත**, 42 පිට, සෝරත සංස්කරණය)

"................ යන මේ රජුන් ඇවෑමෙන් අග්‍රබෝධි නම් රජෙක් විය. ඔහු දවස සක්දමලය, අසක්දමලය, දැමිය, බදබිරිය, දළබිසෝය, අනුරුත් කුමරුය, දළගොත් කුමරුය, දළසල කුමරුය, කිත්සිරි කුමරුය, පුරවඩු කුමරුය, සූරියබාහුය, කසුබ් තොට ඇපාය යන මේ දෙළොස් මහා කවීහු ඇති වූහ" (**නිකාය සංග්‍රහය**, 81 පිට, සමරනායක)

"ඔහු දවස සද්දමල් නම අසද්දමල් නම දැමි නම ඩැබැරි නම දළබිසෝ නම අනුරුද්ධ කුමාර නම දළගොත් කුමාර නම දලසල කුමාර නම කිත්සිරි කුමාර නම පුරවඩු කුමාර නම සූරියබාහු නම කසුප් තොට ඇපා නමැයි යන මේ දෙළොස් මහා කවීහු වූහ" (**සද්ධර්මරත්නාකරය**, 309 පිට, සුගුණසාර දේවානන්ද සංස්කරණය)

"ඔහු මරා මාන රජ බැන අක්බෝ රජ කුරුඳු වැව බඳවා මනුරජ පිළිවෙළ කරවා තිස් අවුරුද්දක් රාජ්‍යය කළේය. ඔහු දවස දැහැමි කිත් තෙර සුතන් වදලහයි දැනගත යුතු. දගනෙන්, බැරි, මීයො, දළගොත්, පුරවා, පසු, දසලා, තුම, කිත්සිරි, කුසුබු, තොට, ඇපැයි මේ දෙළොස් කවීහු අක්බෝ රජු දවස වූවාහ." (**රාජාවලිය**, 40 පිට, බී. ගුණසේකර සංස්කරණය)

ඉහත ඉදිරිපත් කැරුණු සටහන් පිළියෙල කොට ඇත්තේ කාලනිර්ණයට අනුවය. මේ සටහන්වලින් පැරණිතමය **පූජාවලී** සටහන බව ඉන් පෙනේ. **පූජාවලිය** රචනා කරන ලද්දේ අග්බෝ සමයෙන් සියවස් හතකට පමණ පසුව හෙයින් දෙළොස් මහා කවීන් පිළිබඳ ප්‍රවෘත්තිය ඓතිහාසික සත්‍යයක් ලෙස පිළිගන්නට ඇතැමුන් මැළිවනු පෙනේ. **පූජාවලි** කර්තෘභූත මයුරපාද හිමියන්ට මේ ප්‍රවෘත්තිය ලැබුණේ කෙසේ ද යන්න අවිනිශ්චිත වුව ද උන්වහන්සේ පූර්ව ලිඛිතයන් අනුව මේ විස්තරය ලියා තබන්නට ඇත. **පූජාවලියේ** අග දක්නට ලැබෙන ඉතිහාස කතාව ඊට පෙර සම්භාවිත වූ නොයෙක් විස්තර කතා ආශ්‍රයෙන් රචනා කරන්නට ඇති බවට කිසිදු සැකයක් නැත.

දෙළොස් මහා කවීන්ගේ නාමාවලිය මූලාශ්‍රයන්හි එක ම ක්‍රමයකට දක්නට නොලැබෙන බව ඉහත ඉදිරිපත් කළ ඒ ඒ සටහන් විමසීමෙන් පෙනේ. නාමාවලිය සම්බන්ධයෙන් ලැබෙන විෂමතා සම්ප්‍රදාය භේදයන් නිසා ඇති වූවක් ද යන්න සිතාගැනීම අපහසුය. කෙසේවතුදු මූලික වශයෙන් අපේ සැලකිල්ල යොමු විය යුතු වන්නේ නාමාවලිය වෙතය.

මේ පිළිබඳව ආදිතම සටහන **පූජාවලිය** යයි ඉහත පැවසිණ. එහෙත් **පූජාවලී** නාමාවලිය අවුල් සහගත එකකි. කවීන් දෙළොස් දෙනෙකුගේ නම් එයින් තෝරා බේරා ගැනීම අපහසුය. එම නාමාවලිය නම් දෙළසකට වෙන් කිරීමට නම්, "කසුබ් තොට ඇපා" යන්න නම් තුනක් වශයෙන් සැලකිය යුතුය. බොහෝ **පූජාවලී** සංස්කාරකයන් එසේ සලකා ඇති බව ද පෙනේ. එහෙත් **දළදා සිරිත** ආදියෙහි එය එක් නමක් හැටියට පැහැදිලි ලෙස පෙන්නුම් කර දී තිබේ. මෙහි ඇති "තෙලේ" යන්න අනික් සටහන්වල දක්නට නොලැබෙන්නකි. මේ තෙලේ යන්න ඇතැම් **පූජාවලී** පිටපතක ඇත්තේ "තෙමල්" යනුවෙනි. නම් දෙළස දක්වන ඇතැම් සටහනක "මාමල්" යන්නක් දක්නට ඇති හෙයින් නියම පාඨය "තෙමල්" යයි ගතහොත් **පූජාවලී** කතුවරයා ඉන් අදහස් කරන්නට ඇත්තේ "සක්දමල්", "අසක්දමල්" සහ ඒ "මාමල්" යන "මල්" තිදෙනාද යනු විමසිල්ලට ලක් කළ යුතු අදහසකි. **පූජාවලී** සටහනෙහි අනික් සටහන්හි ඉතා ප්‍රකට සක්දමල්, අසක්දමල් යන දෙනාමයන්



දක්නට නොලැබීම ද මෙයට සාධකයක් වශයෙන් ගත හැකිය. මේ ගැන සැලකිලිමත් නොවූ **පූජාවලී** සංස්කාරකයන් "කසුබ් තොට ඇපා" යන්න නම් තුනක් වශයෙන් කඩා දැක්වූ බව පෙනේ. ඉහත කී අදහස සත්‍ය නම් **පූජාවලී** සටහනින්ද දෙළොස් මහා කවියන් හඳුනාගනු පිණිස එවැනි අශාස්ත්‍රීය යමක් කිරීම අවශ්‍ය නො වේ. එහෙත් **පූජාවලිය** පැහැදිලි ලෙස මේ තත්ත්වය පිළිබඳව එළියක් සපයන්නේ නැත. මේ හැරුණු විට **පූජාවලියෙහි** එන "දළනුරත්" යන්න අනික් සටහන්හි එන දළබිසෝ යන නාමයෙහි ඇති "දළ" යන්නත් "අනුරුත්" යන්නත් එකතු වීම නිසා නිපන් නමක් දැයි විමසිය යුතුය. නාමයන් දෙළසක් වෙන් වශයෙන් දැක්විය යුතු තැනකදී නම් දෙකක් සන්ධි කොට දැක්වීම අයෝග්‍ය හෙයින් ද, අපැහැදිලි හෙයින් ද, **පූජාවලී** කතුතුමා එවැන්නක් අදහස් කරන්නට නැත. එහෙත් "දළ බිසෝ" යන්න **පූජාවලියෙහි** දක්නට නොලැබීම මෙහිදී සැලකිල්ලට ගත යුතුය. අනෙක් නම් සම්බන්ධයෙන් පෙනෙන ඉතා සුළු වෙනස්කම් හැරුණු විට දෙළොස් මහා කවීන්ගේ ආදිතම සටහන හැටියට **පූජාවලී** සටහනේ වැදගත්කම ඉහත පෙන්නුම් කළ දුර්වලතා අතරින් කැපී පෙනේ. **පූජාවලී** කතුතුමා මේ නම් ඉදිරිපත් කිරීමේදී පැහැදිලි රචනා විලාසයක් අනුගමනය නොකිරීමෙන් බොහෝ දුරට එම සටහන අවුල් වී ඇති බව පෙනේ.

මේ සම්බන්ධයෙන් නව්‍යතම සටහන ඇත්තේ **රාජාවලියේය**. එය **පූජාවලී** සටහනටත් වඩා අවුලින් ගහනය. එහි එන නම් කිහිපයක් අනෙක් සටහන් හා සැසඳෙන්නේ නැත. එහි එන බැරි, දළගොත්, පුරවා, දසලා, කිත්ගිරි යන නම් අනික් සටහන්හි එන පහත එන නම් සමඟ සැසඳිය හැක. බදබිරි, දළගොත්, පුරවඩු, දලසල, කිත්සිරි, කසුබ් තොට ඇපා යන්න **රාජාවලියද** නම් තුනක් වශයෙන් සලකා ඇත. මේ **රාජාවලී** සටහනද ග්‍රන්ථශෝධකයන් විසින් විපරීත කොට ඇති බවට චෝදනා ඉදිරිපත්ව ඇත. **රාජාවලී** ඇතැම් සංස්කරණයක දෙළොස් මහා කවීන්ගේ නාමාවලිය නිකාය සංග්‍රහයෙහි එන එම නාමාවලිය සමඟ සැසඳෙන සේ සකස් කරන්නට දරන ලද පැහැදිලි උත්සාහයක් පෙනේ.[1] එය පැරණි පිටපත් සමඟ කොතෙක් දුරට ගැළපේද යනු තීරණය කළ නොහැක. දහනෙන්, මියො, පසු, තුම යන **රාජාවලී** සටහනේ නම් හඳුනාගත නො හැකිය. "දහනෙන්" යනු "දැමි" යන්න සමඟ සැසඳිය හැකි වෙතත් එය එතරම් පැහැදිලි නැත. "කුම" යනු නාමයක් නොව අනික් සටහන්හි කිහිපවරක් එන "කුමරු" යන්නේ විපර්යාසයක් විය හැකිය. මේ අනුව දෙළොස් මහා කවීන්ගේ පැහැදිලි නාම ලේඛනයක් පිළියෙල කිරීමේදී **රාජාවලී** සටහනින් එතරම් ප්‍රයෝජනයක් ලද නොහැකිය.

ඉතා පැහැදිලි ලෙස මේ නාමාවලිය ඉදිරිපත් කරන ග්‍රන්ථ තුනක් අපතර වන බව ඉහත ඉදිරිපත් කළ සටහන් විමසීමෙන් පෙනේ. **දළදා සිරිත, නිකාය සංග්‍රහය** හා **සද්ධර්මරත්නාකරය** යනු ඒ ග්‍රන්ථ තුනයි. මේ ග්‍රන්ථ තුන නාමාවලිය ඉදිරිපත් කිරීමේදී පැහැදිලි රචනා විලාසයක්

අනුගමනය කිරීමෙන් සියලු අවුල් මගහරවා ඇත. **දළඳ සිරිත** ඒ ඒ නමින් පරව "යැ" යෙදීමෙන් ද, **නිකාය සංග්‍රහය** "ය" යෙදීමෙන් ද **සද්ධර්මරත්නාකරය** "නම" යෙදීමෙන් ද පැහැදිලිව නම් දෙළස වෙන් කොට දක්වා ඇත. මේ ග්‍රන්ථත්‍රයේ නම් පිළිබඳව දක්නට ලැබෙන්නේ සුළු වෙනස්කම්ය. නිකාය සංග්‍රහයේ එන "බදබිරි" යන්න **සද්ධර්මරත්නාකරයේ** එන්නේ "ඩැබැරී" කියාය. එය ම **දළඳ සිරිතේදී,** "මාලා බදබිරී" යනුවෙන් එයි. **නිකාය සංග්‍රහයේත්, දළඳ සිරිතේත්** එන 'අනුරුත්' යන්න **සද්ධර්මරත්නාකරයේ** "අනුරුධ" යනුවෙන් ගළපා ඇත. මේ සුළු වෙනස්කම් හැරුණු විට අනෙක් නම් සමානය. එහෙයින් යථෝක්ත මාතෘකාව විමසීමේ දී එකඟ බවක් උසුලන මේ සටහන් තුන වෙත අපි විශේෂ අවධානය යොමු කළ යුතු වෙමු.

මේ නාමාවලිය සම්බන්ධයෙන් **පූජාවලිය** කවර සටහනක් උපයෝගී කර ගන්නා ලදදැයි පැහැදිලි නැතත් **පූජාවලි** සටහන අනෙක් සටහන් කෙරෙහි බලපා ඇත. විශේෂයෙන් **පූජාවලි** සටහන බලපා ඇත්තේ **රාජාවලියටය. නිකාය සංග්‍රහයේත් සද්ධර්මරත්නාකරයේත්** සටහන් දෙකට **දළඳ සිරිතෙන්** කිසියම් පිටිවහලක් ලැබී ඇති බවද පෙනේ. නාමාවලිය සම්බන්ධයෙන් පැනෙන විෂමතාවලින් පැහැදිලි වන්නේ මේ නම් ව්‍යවහාරය සම්බන්ධයෙන් ආදියේ පටන්ම මතභේද කිහිපයක් පැවති බවයි. සමහර විට එක් කවියකු සඳහා ව්‍යවහාර වූ නාම කිහිපයක් තිබීමෙන් ද මේ මතභේදය හටගන්නට පුළුවන. එහෙත් මේ සම්බන්ධයෙන් ස්ථිර කිසිවක් කිව නො හැකිය.

දෙළොස් මහා කවීන් ගැන ලියා ඇති හැම තැනෙකම පාහේ වැඩි වශයෙන් භාවිත කොට ඇත්තේ **නිකාය සංග්‍රහයේ** ආ සටහනය. එහෙත් **නිකාය සංග්‍රහ** සටහනට වඩා **දළඳ සිරිත** සටහන පැරණිය.[2] **දළඳ සිරිත** සටහන **නිකාය සංග්‍රහයේ** සටහන තරම්ම පැහැදිලිය. මේ නිසා අපේ විමසුමේදී වැඩි වශයෙන් ආශ්‍රය කරන්නට සිදුවන්නේ **පූජාවලි** සටහනත්, **දළඳ සිරිත** සටහනත්ය. **පූජාවලියේ** පෙනෙන දුර්වලතා කිසිවක් **දළඳ සිරිත** සටහනේ නැති බව යළි සිහියට නගාගත යුතුය.

දෙළොස් මහා කවීන්ගේ නාමාවලියේ පෙනෙන නම් කිසියම් ක්‍රමයකින් හඳුනාගත හැකි ද? ඒ නාමාවලිය සාහිත්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වැදගත් වන්නේ කවර කරුණු නිසාද? යන ප්‍රශ්නවලට පිළිතුරු සපයා ගන්නට මෙතැන් පටන් උත්සාහ ගත යුතුය.

මේ නම් අතර ස්ත්‍රී නාම කිහිපයක් තිබීම විශේෂයෙන් වැදගත් කරුණකි. මක්නිසාද යත් පුරාණ සිංහල ස්ත්‍රිය කාව්‍යකරණයෙහි නියැලුණු බවට අප හමුවේ ඇති සාක්ෂ්‍ය ඉතා විරල හෙයිනි. සීගිරි කැටපත් පවුරෙන් වුවද මේ සම්බන්ධයෙන් ලබාගත හැකි සාධක සුලබ නො වේ. එහෙයින් මේ නාමාවලියෙහි එන ස්ත්‍රී නාම අපේ සිත් ඇද ගනියි. **රාජාවලියේ** එන "දසලා" යන්න ස්ත්‍රී නාමයක් හැටියට සැලකිය හැකි වුවත් අප මුලදී හඳුනාගත් පරිදි එය දලසල යන්නෙහි විකෘතියක් නම් එය වැරදි විය යුතුය. **දළඳ සිරිතේ** එන මාලාබදිරි යනුද ස්ත්‍රී නාමයක ස්වරූපය ගනියි. බදබිරි යන්න තනිව ගත්තත් ස්ත්‍රී නාමයක්



වැනි වුවද **දළඳ සිරිතේදී** අමුතුවෙන් එකතුව ඇති "මාලා" යන්නෙන් එය වඩාත් තහවුරු වෙයි. "දළබිසෝ" යන්න නම් නිසැක ලෙස ස්ත්‍රී නාමයක් වශයෙන් හඳුනාගත හැකියි. "බිසෝ" යනු "බිසව" යන අර්ථය ගෙන දෙන උප පදයක් විය හැකිය. ඒ අනුව ඇයගේ රාජකීත්වය හෙළිවේ. මේ "දළබිසෝ" හඳුනාගැනීම පිණිස **මහාවංසයෙන්** ද කිසියම් එළියක් ලැබෙනු පෙනේ. **මහාවංසය** 1 අග්බෝ රජුට "දාඨා" නම් දුවක් සිටි බවත්, ඇය මලය රජුට පාවා දුන් බවත් සඳහන් කරයි.[3] මේ මලය රජු අග්බෝවන්ගේ බෑනණුවන් බව දුව පාවාදීම ගැන කියන්නට පළමුවද **මහාවංසයේ** සඳහන්ව ඇත.[4] දෙළොස් මහාකිවීන්ගේ නාමාවලියේ එන දළබිසෝ මේ දාඨා කුමරියදැයි සෙවිය යුතුය. "බිසෝ" යන්න නමේම කොටසක් වශයෙන් නොගෙන එය ඇගේ රාජකීයත්වය පෙන්වන පදයක් හැටියට සලකතොත් "දාඨා" යන්න "දළ" යන්නට පර්යාය බව පැහැදිලි හෙයින් එසේ නිගමනය කිරීම නිවැරදි විය හැකිය. එහෙත් දළබිසෝ අග්බෝවන්ගේ දුවය. මලය රජුගේ භාර්යාවය යන මේ කරුණු හැරෙන්නට ඇගේ සාහිත්‍ය සේවාව පැහැදිලි පරිදිම අප්‍රකටය.

අනෙක් සියලු නාම පුරුෂ නාම බවට සැකයක් නැත. එයිනුත් අනුරුත් කුමරු, දළගොත් කුමරු, දළසල කුමරු, කිත්සිරි කුමරු, පුරවඩු කුමරු, කසුබ් තොට ඇපා යන අය රාජකීයයන් වූ බව "කුමරු", "ඇපා" යන පදවලින් පෙනේ. ඇපා යන්න පුරාණ රාජ්‍ය පාලන ක්‍රමයට අනුව වැදගත් තනතුරකි. ඇපා කෙනෙකුට රාජ්‍යත්වය පිළිබඳවද බලාපොරොත්තු තැබිය හැකි විය. "කුමරු" යනු පැහැදිලිවම රජ පවුලට ඇති සම්බන්ධය දක්වයි. මේ අනුව දෙළොස් මහා කවීන්ගෙන් වැඩි දෙනෙකු රජ පවුලේ අය යයි තීරණය කිරීමට සිදුවේ. අනුරාධපුර යුගයේ සාහිත්‍යක්ෂේත්‍රය විමසන විට රජුන් ග්‍රන්ථකරණයෙහි නියැළී සිටි බව ඉතා ප්‍රකට හෙයින් මෙය ස්වාභාවික කරුණකි.[5]

කසුබ් තොට ඇපා යන්න පිළිබඳවද මහාවංසය ආශ්‍රයෙන් යම් හැඳිනීමක් ලද හැකිය. අග්බෝ රජු ස්වකීය මාමණ්ඩිය උපරජ වශයෙන්ද සහෝදරයා යුව රජ වශයෙන්ද පත් කළ බව **මහාවංසය** කියයි.[6] ඇපා තනතුර හා ඉහත කී තනතුරු දෙකෙහි කිසියම් සම්බන්ධකමක් විණි නම් ඒ තනතුරු දෙකෙන් එකකට පත් කරන්නට ඇත්තේ එකල විසූ ඇපා කෙනෙකි. 1 අග්බෝ රජු කල සිටි ප්‍රසිද්ධ "ඇපා" නම් කසුබ්තොට ඇපාය. ඒ කරුණු එසේ නම් හෙතෙම රජුගේ මාමා හෝ සහෝදරයා වශයෙන් හඳුනාගත හැකිය. මුලදී ඇපා කෙනෙකුව සිටි ඔහුට පසු කලෙක උපරජ හෝ යුවරජ තනතුර ලැබෙන්නට ඇත. එහෙත් මේ කරුණු ඓතිහාසික සාක්ෂ්‍ය අනුව ස්ථිර කළ හැක්කක් නො වේ.

මේ රාජකීයයන් හැර අනෙක් කවීහු සාමාන්‍ය පන්තියේ අය වූහ. එහෙත් ඔවුන් උසස් කවීන් වූ බවට සැකයක් නැත. ඔවුන් ගැන නිසැක, විශේෂ යමක් දත නො හැකිය. එහෙත් ඔවුන්'තර වන "දාමි" විශේෂ සඳහනකට හිමිකම් ලබයි. **රාජාවලියේ** මේ නම නැතද අනෙක් සෑම මූලාශ්‍රයක ම පෙරටුව එන්නේ "දාමි" යන නාමයයි. මේ දාමියන්

**අමාවතුරත් ධර්මප්‍රදීපිකාවත්** කළ ගුරුළුගෝමීන් හැටියට හඳුනාගන්නට මහත් ප්‍රයත්නයක් දරා ඇත.[7] මේ මතය තහවුරු කිරීමෙහි ලා මූලික වශයෙන් උපයෝගි කරගන්නා සාධකයේ අසාර්ථකත්වය පිළිබඳව පසුව විමසේ. "දෑමි" සහ "ගෝමි" යන නම් අතරේ අර්ථ වශයෙන් කිසියම් සාම්‍යයක් විද්‍යමාන වුව ද ගරුළුගෝමී පඬිතුමා 1 අග්බෝ රජු කල වූවකු හැටියට ගණන් ගත නොහැකිය. ගුරුළුගෝමීන්, පොළොන්නරු යුගයේ ලියැවුණු **ජිනාලංකාර වර්ණනාවෙන්** අදහස් ගැනීම, එකල ගිහි පණ්ඩිතයන්ගේ නාමාවලියේ ගුරුළු ගෝමීන්ගේ නම සඳහන්ව තිබීම,[8] දඹදෙණි යුගයේ රචිත **සිදත් සඟරාවෙහි** ද ඔහුගේ නම 'ගුරුළු ගෝමි, සඳ ගෝමි" ඈ විසින් දක්නට තිබීම ගුරුළු යන්න ඔහුගේ නම හා නොකැඩිය හැකි සේ සම්බන්ධව තිබීම හා **ධර්ම ප්‍රදීපිකාවේත් අමාවතුරේත්**, භාෂා ශෛලිය යන කරුණු අනුව ගුරුළුගෝමීන් අනුරපුර යුගයේ විසූ පුද්ගලයෙකු වශයෙන් හඳුනාගත නො හැකිය. එම නිසා දෙළොස් මහා කවීන්ගේ නාමාවලියේ එන "දෑමි" ගුරුළුගෝමීන් සමඟ හඳුනාගත නොහැකිය.

මේ 'දෑමි' යනු තෙර කෙනෙකු හැටියට හඳුනාගන්නට දරන ලද උත්සාහයක් ද වේ.[9] ඒ සඳහා සාධක වශයෙන් ගෙනහැර පා ඇත්තේ ඉහත සඳහන් **පූජාවලී** පාඨයේ එන "ඔහු දවස දෑමි මහ තෙරහු සුතත් දෑ වදළහයි දත යුතු" යන වාක්‍යයයි. ඉහත සඳහන් **පූජාවලි** පාඨය සපුරා කියවීමේ දී දෑමියන් සම්බන්ධයෙන් එවැනි අදහසක් පහළ කරගත නො හැකිය. මුල් වගන්තියෙන් දෑමි සුතන් දෑ වදළ තෙර කෙනෙකු යයි පවසා ඊළඟ වගන්තියෙන් ඔහුම ගැන නැවතත් යමක් කියන්නට **පූජාවලි** කතුවරයාට වුවමනා වූ බවෙක් නො පෙනේ. මේ අනුව මේ දැමි තෙරහුත් පසුව කී දෑමියනුත් දෙදෙනෙකු කොට සලකා ගන්නට සිදු වෙයි. 'දෑමි' නමින් ගිහියකු ද පැවිද්දකු ද වූ බව **පූජාවලි** සටහනින් වුවද පැහැදිලි වේ. මේ සම්බන්ධයෙන් ඉතා වැදගත් පාඨයක් **රාජාවලියේද** එයි. එය මෙසේයි." ඔහු දවස දෑහැමි කිත් තෙරහු සුතන් වදළහයි දත යුතු" **රාජාවලී** කාරයා අමුතුවෙන් මේ නමට කිත් සන්නත් එකතු කළා පමණක් නොව "දෑමි" යන්න "දෑහැමි" බවටද පමුණුවා ඇත. මෙයින් දෑමි කිවියාත් සුතන් දෑ වදළ තෙරහුත් එක් කෙනෙකුන් නොවන බව මැනවින් ප්‍රකට වෙයි. සුතන් දෑ වදළ තෙරහු **රාජාවලි** පාඨයට අනුව දහැමි කිත් (ධර්මකීර්ති) නම් වූ බව පෙනේ. **රාජාවලියෙත් පූජාවලියෙත්** සඳහන් වන මේ තෙරුන් සූත්‍රාන්ත දෙසීමෙහි සමතෙකි. එහෙත් 'දෑමි' කාව්‍යකරණයෙහි සමත් ගිහියෙකි.

"දෑමි" යනු ඉපැරණි තනතුරකි. බණ වජාරන දමීනට ඉසා ඇඳුර දමීනට ඉසා දමීන් සජනක් හට ඉසා"යි මිහින්තලා ලිපියෙහි දමීහු සඳහන් වෙති. ඔහු ධර්ම දේශකයෝයැ ආචාර්‍යවරයෝ යැයි දෙපරිදි වෙත්. මේ ඇත්තනට රජුන් තනතුරු දුන් බව පැරණි ලිපියෙන් පෙනේ. මේ පඬිවරුන් දහම් දෙසීමෙනුදු දහම් උගන්වාලීමෙනුදු දුසිරිත් බිඳහැර



රටෙහි දුර්දන්තයන් දමනය කරමින් රජුට සේවා කළහයි සිතම්හ. එයින්ම රජුන් අතින් "දෑමි තනතුරු" ලැබැ සාධු සම්මතයහ" යනුවෙන් කෝදගොඩ ඤාණාලෝක නාහිමියෝ දෑමියන් ගැන අනගි විස්තරයක් කරති.[10] මේ හැර 'දෑමි' නමින් වංශයක් වූ බවට ද සිතාගත හැකි පැරණි සාක්ෂ්‍ය විද්‍යමාන වේ.[11] ගුරුළුගෝමීන් මතු නොව දෙළොස් මහා කවීන්ගේ "දෑමි" යන් ද 'දෑමි' තනතුර ලද්දෙකු හෝ දෑමි වංශිකයෙකු විය හැක. දෑමියන් පරම්පරාගත උගතුන්ව සිටි බවත් ඔවුන්ගේ කාර්යයන් ශාස්ත්‍රීයමය පක්ෂයට බරවූ බවත් ඉහත ඇති සෙල්ලිපි පාඨයෙන් තව දුරටත් පැහැදිලි වේ.

මේ හැර "දෑමි" කිවියා ගැන සොයාගත හැකි තොරතුරු අපතර නැත. ඔහුගේද සාහිත්‍ය සේවාව අප්‍රකටය. නම පමණක් ඉතිරි කොට ගිය පැරණියන් අතරට ඔහු ද ප්‍රවිෂ්ට වෙයි.

සක්දමල, අසක්දමල යන නාමයන් ගැන පැවසිය හැක්කේ ඒවා සම්ප්‍රදායානුකූලව යෙදී ඇති නාමයන් බවයි. මේ දෙතැන එන "මල්" යනු "මල්ල" යන්නෙන් බිඳී ආවක් බව පෙනේ. මේ ගණයෙහි ලා සැලකිය හැකි නම් රාශියක් සීගිරි කැටපත් පවුරෙන් ලැබී ඇත. "දෙවල්මල", "කොතලමල" හා "බුදස් මල" යනු ඉන් කිහිපයකි. දළගොත් යන්නෙහි "ගොත්" යන්න "ගුප්ත" යන්නෙන් බිඳී ආවකි. එසේ වුවහොත් දළ ගොත් යනු දාඨාගුප්ත යන්නේ සිංහල ව්‍යවහාරයයි.

මේ දෙළොස් මහාකවීහු කවර විෂයයන් අරභයා කවර භාෂාවකින් කාව්‍යකරණයෙහි නිරතවූහු ද යනුත් විමසිය යුතු කරුණකි. මොවුන් ගැන සඳහන්වන හැම තැනකම ඇත්තේ "දෙළොස් මහාකවීහු" කියායි. කවි ශබ්දය පද්‍ය රචකයන්ට පමණක් නොව පණ්ඩිතයන් සඳහා ද ව්‍යවහාර වන්නක් වුවද මෙතැන්හිදී අදහස් කරන්නට ඇත්තේ මුල් අර්ථයයි. එකල ස්වාභාවික ක්‍රමය අනුව කාව්‍යකරණයෙහි නියැලුණේ පණ්ඩිතයන් ම හෙයින් එසේ ගැනීම අයුක්ති නො වේ. ඒ අනුව මූලික වශයෙන් මොවුන් දෙළොස් දෙනම පද්‍යකාරයන් වූ බව පිළිගැනීමට සිදුවෙයි. ඒ සමග ම ඔවුන්ගේ මාධ්‍යය සිංහල භාෂාව වූ බවද සිතාගත හැකිය. පාළි හෝ සංස්කෘත මාධ්‍යයෙන් ග්‍රන්ථකරණයෙහි යෙදුණු ගිහි උගතුන් ගැන පුරාණ සිංහල සාහිත්‍යයෙන් එතරම් තොරතුරක් නොසැපයෙන හෙයිනි. මේ කරුණෙහි ලා වඩාත් සැලකිය යුතු සටහනක් **මහාවංසයෙන්** අපට ලැබේ. **මහාවංසයේ** අග්බෝ රජු ගැන කරන විස්තරයේ මෙසේ කියවෙයි.

කවයො තස්ස රජ්ජම්හි - සීහළාය නිරුත්තියා
කාවෙය්‍යා බහුතේකංසු - විචිත්‍රනය සාලිනො.

(244 පිට ඌනපූරණ සහිතො **මහාවංසො**)

"ඒ රජුගේ රාජ්‍ය කාලයෙහි කවීහු සිංහල භාෂාවෙන් බොහෝ විචිත්‍ර කාව්‍යයන් රචනය කළහයි එයින් පැවසේ. මෙහි "කවයො"යි කීවේ මේ දෙළොස් මහා කවීන් ගැනම විය හැක. මේ සමය සිංහල

සාහිත්‍යය සම්බන්ධයෙන් වැදගත් වන්නේද දෙළොස් මහාකවි කෙනෙකුන් සිංහල භාෂාවෙන් කාව්‍ය ග්‍රන්ථ රාශියක් ප්‍රබන්ධ කළ බවට මේ අන්දමේ සාක්ෂ්‍ය ලැබෙන නිසාය.

මේ දෙළොස් මහාකිවියන්ගෙන් කිසිවෙකුගේ කිසියම් කෘතියක් පිළිබඳ අනාවරණය වන කරුණු ඇත්ද යනු මීළඟට සලකා බලමු. මේ සම්බන්ධයෙන් විමසිය යුතු ප්‍රධාන සාධක දෙකක් අප හමුවේ තිබේ.

ඉන් පළමුවැන්න දළසල කුමරුගේ ග්‍රන්ථයක් පිළිබඳ ඇති මතයයි. වෙල්ලාල ජයමහ දළසල කුමරුගේ කෘතියක් හැටියට **සැරය** නමින් කාව්‍යයක් මුද්‍රණයට පමුණුවා තිබේ. එහෙත් මේ කෘතිය කෙරෙහි සිංහල භාෂා සාහිත්‍යය ගැන විමසන්නවුන්ගේ අවධානය එපමණට යොමු වූයේ නැත. එසේ වූයේ ගුරුකුල භේදයන් නිසා නොව සැබවින්ම ඊට පිටදුන් සාධාරණ කරුණු කිහිපයක් නිසාය. පුරාණයේ විසූ කීර්තිමත් කිවියෙකුගේ අප්‍රකට ග්‍රන්ථයක් එළිදැක්වීම නිසා පාඨකයන් අතර සාමාන්‍යයෙන් හටගන්නා උනන්දුව එම **සැරය** නිසා ඇතිවූ බව කිව නො හැකිය. පැරණි ග්‍රන්ථයක් ප්‍රථම වරට මුද්‍රණයෙන් නිකුත් කිරීමේදී අනුගමනය කැරෙන සාමාන්‍ය ශාස්ත්‍රීය සම්ප්‍රදායට ද නොඑකඟව එම ග්‍රන්ථය මුද්‍රණයෙන් එළිදැක්වුණේය. එහි ඇති දීර්ඝ හැඳින්වීම ශාස්ත්‍රීය ගවේෂණයක ප්‍රතිඵලයක් හෝ එම පොත ගැන කරන විස්තරයක් නො වේ. ගුරුළුගෝමීන් ගැන එම **සැරයේ** ඇති සඳහන් කැලම ප්‍රතික්ෂේප කළ යුතුය. පැරණි පිටපත් ගැන හෝ ආශ්‍රය කළ පිටපත් සංඛ්‍යාව ගැන හෝ එහි කිසිම විස්තරයක් දී නැත. පිටපත් කිහිපයක් ආශ්‍රය කළ බව අඟවන්නට මෙන් සමහර වදන් සම්බන්ධයෙන් අප පාඨ අධෝ ලිපි වශයෙන් ඇතද ආශ්‍රය කළ පිටපත් ගැන සඳහනක් නැති හෙයින් ඒ ගැනද සැක පහළ වේ. අනෙක් අතට **සැරයේ** එන භාෂාවත්, වස්තුවත් කාලීන යෝග්‍යතාවට පත්ව නැත. මෙය දූත කාව්‍යයක් හැටියට පෙන්වා දී ඇතත් මේ සමය වන විට දූත කාව්‍ය ලක්ෂණ සිංහල සාහිත්‍යය තුළ වගාවී ද යනුත් සැකයකි. එහි එන ඇතැම් විරිත් හා එළිවැට ගී කාව්‍යයන්හි සීගිරි පද්‍යයන්හි ස්වරූපයට වෙනස්ය, අලුත්ය, භාෂා ශෛලියෙහි ද අග්බෝ සමයට මෑත කාලීන ලක්ෂණ සුලබව විද්‍යමාන වේ. මේ කරුණු නිසා වෙල්ලාල ජයමහ විසින් ප්‍රසිද්ධ කැරුණු **සැරය** අග්බෝ රජු සමයේ විසූ දළසල කුමරුන්ගේ කෘතියක් හැටියට සලකන්නට ඉඩක් නැත. එසේ සලකන්නට දරා ඇති උත්සාහය ඉහත කී දුර්වලතා නිසා ව්‍යර්ථ වී ඇත. සංස්කරණය කළ ලේඛකයා මේ දුර්වලතා මතු වූ අවස්ථාවන්හි දී බොහෝ දුරට මුනිවත රැක්කේය. එහෙයින් දළසල කුමරුන්ගේ කෘතිය දැනට අප අතර අවිද්‍යමාන යයි තීරණය කිරීම අයුක්ති නො වේ.

අප ඉදිරියේ ඇති දෙවැනි සාධකය මෙසේ පහසුවෙන් ප්‍රතික්ෂේප කළ හැක්කක් නො වේ. එය නම් **අසක්ද කව**ක් ගැන දැනගන්නට තිබෙන කරුණු හා අපේ කවියන් අතර සිටින අසක්දමල නම් කවියා සමඟ එම ග්‍රන්ථය සම්බන්ධ කර තිබීමයි. මේ **අසක්ද කව** ගැන **සිදත් සඟරා**



පුරාණ සන්නයෙහි කිහිප පළකම සඳහන් වේ. **සිදත් සඟරා** පෙළෙහි උදහරණ හැටියට දී ඇති ඇතැම් පාඨ උපුටාගෙන ඇත්තේ එම **අසක්ද කවෙනැයි සිදත් සඟරා පුරාණ සන්නය** පවසයි. යටත් පිරිසෙයින් මෙවැනි පාඨ සතරක් වත් **සිදත් සඟරාවෙන්** සොයාගත හැකිය.[12] **සිදත් සඟරා පුරාණ සන්නය** පවසන හැටියටත් අප හමුවේ ප්‍රමාණවත් පාඨ කිහිපයක් ඉතිරිව ඇති හෙයිනුත් **අසක්ද** නම් කාව්‍යයක් වූ බවට සැකයක් නැත. එහෙත් **අසක්ද කව** යනු කුමක් ද? එහි කතුවරයා කවරෙක්ද? යනු පහසුවෙන් නොවිසඳේ.

**අසක්ද කව**, අසක්දමල නම් කවියාගේ කෘතියක් හැටියට බොහෝ දෙනා සලකති. නාමද්වය අතර ඇති සමානත්වය හැරෙන්නට මේ මතය ස්ඵුට කරන්නට අනෙක් සාධකයක් නැත. අනෙක් අතට එය කවර යුගයක රචිත ග්‍රන්ථයක්ද යනුත් තීරණය කළ නො හැකිය. **සිදත් සඟරාව** සමකාලීන කෘතියක් වූ **කව්සිළුමිණෙන්** ද උද්ධෘත පාඨ දක්වා ඇති හෙයින් **අසක්ද කවේ** කාල නිර්ණය කිරීම පහසු නැත. **අසක්ද කවේ** වූ බවට උපුටා දක්වා ඇති පාඨයන්හි භාෂාව අප හමුවේ ඇති අනෙක් ගී කාව්‍යයන්ගේ භාෂාවට සමානය. සීගිරි ගී බස හා තරමක සමානත්වයක් පැනෙන හෙයින් වරින්වර පිටපත් කිරීම නිසා වෙනස් වූ අනුරපුර යුගයේ කෘතියක කොටස් හැටියට සලකන්නට ද එම පාඨවලින් බාධාවක් නො පැමිණේ. **අසක්ද කව** අනුරපුර යුගයේ රචිත කෘතියක් හැටියට තීරණය කළත් එය අසක්දමල නම් කවියාට පැවරිය හැක්කේ කවර සාධක අනුව ද? යන ප්‍රශ්නය නිතැතින්ම අප හමුවට ඒ.

**අසක්ද කව** හඳුනාගන්නට ප්‍රමාණවත් ප්‍රයත්න දෙකක් අප දන්නා පමණට සිදු වී ඇත.[13] ඒ අනුව **අසක්ද කව**, **ජාතක පොතේ** අසංකා (ආසංඛවතී) ජාතකය ගීයට නැගීමයි. මේ අනුව **අසක්ද කව**ද "පෙදෙන් බුදු සිරිතැ" යන සම්ප්‍රදායට එකඟව ලියවී ඇත. **අසක්ද කව** යන්නෙහි "ද" යනු කුසද, වෙසතුරුද යන තැන්හි මෙන් ජාතක වාචීව යොද ඇත. "අසක්" යන්න "ආසංකා" යන්නෙන් බිඳී ආ හැකියි. **සිදතේ** උපුටා දක්වා ඇති පාඨ ආසංකා ජාතකය හා උචිත පරිදි ගළපාලිය හැකිය. මේ කරුණු නිසා **අසක්දකව** යනු ආසංකා ජාතකය ගීයට නැගීමක් ලෙස නිවැරදි ලෙසත් නිසැක ලෙසත් පිළිගත හැක. එය එසේ නම් **අසක්ද කව** අසක්දමල කවියාගේ කෘතියක් හැටියට සලකන්නට බාධා පැමිණෙයි. අසක්ද කවට එම නම ලැබුණේ අසක්දමල කවියා එය කළ නිසා නොව ආසංකා ජාතකය කවියට නැඟීම නිසා බැව් ඉතා පැහැදිලි හෙයින් නම් දෙකේ සාම්‍යය අනුව නගන තර්කය බිඳවැටේ. කර්තෘ නාමයෙන් හැඳින්වෙන පැරණි සාහිත්‍ය කෘතියක් ගැන පැරණි සාහිත්‍යයෙන් සාක්ෂ්‍ය නො ලැබේ. එය **අසක්දකව** සම්බන්ධයෙන් පමණක් ගැළපිය හැක්කේ කෙසේද? මේ කරුණු අනුව "**අසක්ද කව** කළ හෙයින් අසක්දමල යයි ද එසේම **සක්ද** යයි කවක් නිපයූ හෙයින් සක්දමල යයිද පසු කලෙක මේ කවීන් දෙදෙනා අපර නාමයකින් පළට වන්නට ඇතැයි සිතීම යුක්ති යුක්තයි[14]" යන්න ප්‍රතික්ෂේප කළ යුතුය.

සක්ද කවක් ගැන නාම මාත්‍ර වශයෙන් හෝ කිසිවක් දත නොහැකිව තිබියදීත් ග්‍රන්ථ නාමාශ්‍රයෙන් ග්‍රන්ථකරණයෙහි නියැලුණවුන්ට අපර නාමයන් ලැබුණු බවට සාක්ෂ්‍ය ලැබිය නොහැකිව තිබියදීත් එවැනි තීරණයකට පැමිණිය හැක්කේ කෙසේ ද?

**අසක්ද කව** අසක්දමලගේ කෘතියක් හැටියට සලකන්නට වුව නො බැරිය. අපේ අදහස නම් එය ඔප්පු කිරීමට කොහෙත්ම සාධක නොමැති බවයි. **අසක්ද කව** ගැන දිය හැකි පැහැදිලි නිරාකූල නිගමනය නම් කර්තෘ හා කාලය අවිනිශ්චිත බුදු සිරිත ගීයෙන් කියූ පැරණි සිංහල කාව්‍ය ග්‍රන්ථයකි යනුයි. මෙහිදී කල්පනාවට ගත යුතු තවත් කරුණක් නම් "අසක්දමල" වෙනුවට **සද්ධර්මරත්නාකරයේ** එන්නේ "අසද්දමල" යනුවෙන් බවත් එය නිවැරදි පාඨය හැටියට සැලකුවහොත් නම් දෙකේ සමතාව අනුව නඟන තර්කය තවත් අසරණ වන බවත්ය.

දෙළොස් මහා කවීන්ගෙන් එකෙකු ලියූ ග්‍රන්ථයක් තබා ඔවුන්ගේ පද්‍යයකුදු අද අපට හඳුනාගන්නට නැත. ඔවුන් බුදු සිරිත හා බෝසත් සිරිත වස්තු කොට ගෙන කාව්‍ය කෘති රාශියක් කරන්නට ඇති බව **මහාවංස** සටහන අනුව සිතා ගත හැකි වුවත් අනුරපුර යුගයේ දී ලියැවුණු අනෙක් බොහෝ ග්‍රන්ථයන් මෙන් ඒවා ද වරින්වර ඇතිවූ ආගමික, දේශපාලන හා සාමාජික විපර්යාස නිසා ද භාෂා සාහිත්‍යය සම්බන්ධයෙන් පැනනැගුණු වෙනස්වීම් හා මතභේද නිසාද විනාශ වී යන්නට ඇත. දෙළොස් මහා කවීන්ගේ කෘති අපතර ඇත්නම් අනුරපුර යුගය සිංහල සාහිත්‍යයේ කෘත යුගය හැටියට සලකන්නට එය ප්‍රබල සාධකයක් වන්නට තිබුණි.

හඳුනාගන්නට නොහැකි වුව ද මේ දෙළොස් මහා කවීන්ගේ පද්‍යයන් අප'තර නැතැයි සිතීම සාවද්‍යය. අප'තර විද්‍යමාන ඇතැම් ග්‍රන්ථ, උපුටාගත් ග්‍රන්ථයන්ගේ නම් සඳහන් නොකරමින් උද්ධෘත කොට පාඨ රාශියක් දක්වා ඇත. **සිදත් සඟරාව, එළු සඳැස් ලකුණ, ලකුණු සර** වැනි ග්‍රන්ථයන්ගෙන් මෙවැනි පාඨ සිය ගණනක් සොයාගත හැකිය. **සියබස්ලකරේ** එන ඇතැම් උදාහරණ ගී ද පැරණි කවියන්ගේ නිර්මාණවලින් උපුටා ගන්නට ඇත. මේ අතර දෙළොස් මහා කවීන්ගේ පබැඳුම් තිබෙන්නට බැරි නැත. **සිදත් සඟරාවෙන්** හෙළිවන **පුරාණ ගී මයුරය** සමහරවිට දෙළොස් මහා කවියන්ගෙන් කෙනෙකුගේ විය හැකිය. **කව්සිළුමිණට** පෙර කුස ජාතකයම වස්තු කොට ලියැවුණු අනෙක් ගී කාව්‍යයක් තිබුණු බවට දෙස් **සිදත් සඟරාවෙන්** ලැබේ. එය අපේ කවියන්ගෙන් කෙනෙකුගේ කෘතියක් විය හැකිය. පුරාණ සම්ප්‍රදයත්, ප්‍රස්තුත මැය යටතේ අප හමුවේ ඇති කරුණු අනුවත් පෙනෙන්නේ දෙළොස් මහා කවීන් ද ගී විරිතම ප්‍රිය කළ බවයි.

දෙළොස් මහාකවීන් ගැන සැලකීමේ දී විශේෂ සැලකිල්ලට ගත යුතු කරුණක් නම් ඒ අතර පැවිදි නාම දක්නට නො ලැබීමයි. පුරාණයේ පටන් ම භාෂා සාහිත්‍යය දියුණුව, ග්‍රන්ථකරණය ආදිය සම්බන්ධයෙන් ලංකාවේදී භික්ෂූන්ට විශේෂ ස්ථානයක් හිමිව තිබුණි. එහෙත් අනුරපුර,



පොළොන්නරු යුගවල සිංහල පතපොත විමසීමේදී පෙනෙන්නේ ගිහියන් පැවිදි පක්ෂයට වැඩි වශයෙන් සිංහල කාව්‍ය ග්‍රන්ථකරණයෙහි නියැළී සිටි බවයි. සිංහල මාධ්‍යයෙන් කාව්‍ය රචනය සඳහා භික්ෂූන් වහන්සේ උනන්දු වූයේ පොළොන්නරු යුගයෙන් පසුව බව පෙනේ. එහෙයින් දෙළොස්මහා කවීන්ගේ නාමාවලියේ භික්ෂු නාම දක්නට නොලැබීම පුදුමයට කරුණක් නො වේ. සිංහල සාහිත්‍යයේ ආදිම යුගවලින් පෙන්නුම් කරන්නේ භික්ෂූන් වහන්සේ විශේෂයෙන් පාලි ග්‍රන්ථ රචනය කිරීමේත් අවිශේෂයෙන් සංස්කෘත මාධ්‍යයෙන්ද ග්‍රන්ථ නිර්මාණය කිරීමේත් යෙදී සිටි අතර ගිහි උගතුන් උන්වහන්සේලාගේ අනුග්‍රහය ඇතිව සිංහල ග්‍රන්ථකරණයෙහි යෙදී සිටි බවයි. මුළුමහත් සාහිත්‍ය ඉතිහාසය ම විමසුවද සිංහල ගිහි උගතකු විසින් විරචිත පාළි සංස්කෘත ග්‍රන්ථ ගැන දත හැක්කේ අල්ප වශයෙනි.

මෙහිදී පැන නගින අනෙක් කරුණක් නම් දෙළොස් මහාකවීන් පිළිබඳ සටහන අග්බෝ සමයේ සාහිත්‍ය ක්ෂේත්‍රය පිළිබඳ සම්පූර්ණ චිත්‍රයක්ද යන්නයි. මීට අමතර ව එසමයෙහි ග්‍රන්ථකරණයෙහි උත්සුක වූ උගතුන් සිටි බව පෙනෙන්නට තිබේ. ඉහත සඳහන් වුණු සූත්‍රාන්ත දේශනා කළ ධර්මකීර්ති තෙරුන් එවැන්නෙකි. මේ කවීන්ගේ නාමාවලිය පිළිබඳ විෂමතාවලින්ද ඇතැම් විට හෙළිවන්නේ මේ කරුණුය. විශේෂයෙන් **රාජාවලියේ** අනෙක් සටහන්හි එන නම් සමඟ හඳුනාගත නොහැකි නාම දෙළොස්මහා කවීන්ට අමතරව එකල සිටි කවියන් විය හැකි බව සිතාගැනීමට පුළුවන. ඒ හැරත් පෙළඅටුවා ආරක්ෂා කරමින්ද එහි සංවර්ධනය සඳහා අමුතු කෘති සපයමින්ද පැවිදි උගතුන් රාශියක් එකල වැඩ සිටින්නට ඇත. **මහාවංසය** මේ සම්බන්ධයෙන් යම් යම් කරුණු අප හමුවේ තබයි. අග්බෝ රජු වෙහෙර විහාර හා ධාතුඝර තනවා සංඝයාට පිදූ බව **මහාවංසය** පවසයි. එකල සංඝයා වහන්සේගේ සංඛ්‍යාව දියුණු එකක් වූ බව **මහාවංසයෙන්** හැඟේ. එහෙයින් අග්බෝ සමයෙහි ග්‍රන්ථකරණයෙහි නියැලි භික්ෂූන් සිටි බවට සැකයක් නැත. මේ අනුව දෙළොස් මහාකවීන් පිළිබඳ ප්‍රවෘත්තිය අග්බෝ සමය පිළිබඳ පැහැදිලි චිත්‍රයක් හැටියට අගය කළ නො හැකිය.

මේ රජු දවස දෙළොස් මහා කවිකෙනෙකුන් වූ බව විශේෂයෙන් සඳහන් වූයේ ඇයිද යනු විසඳිය නොහැකි ප්‍රශ්නයකි. කවියෝ සිංහල භාෂාවෙන් ග්‍රන්ථ තැනූහයි යන මේ ප්‍රවෘත්තිය හැරුණු විට කවීන්ගේ සංඛ්‍යාව පිළිබඳ හෝ ඔවුන් ලියූ පත පොත පිළිබඳව හෝ කිසිදු සටහනක් **මහාවංසයේ** නැත. දඹදෙණි යුගයෙන් පසුව ලියැවුණු සිංහල ග්‍රන්ථවලට මේ ලැයිස්තුව ප්‍රවිෂ්ට වූයේ කෙසේද යනුත් දත නො හැකිය. එහෙත් කිසියම් පුරාණ මූලාශ්‍රයක් ආශ්‍රයෙන් **පූජාවලී** කතුවරයා එම නාමාවලිය ඉදිරිපත් කරන්නට ඇත. එය මයුරපාද හිමියන්ගේ හිතුවක්කාර නිර්මාණයක් නො වේ. එහෙයින් දෙළොස් මහා කවීන් පිළිබඳ පුවත ඓතිහාසික අසත්‍යයක් හැටියට සලකා බැහැර ලිය නො හැක.

අග්බෝ රජු දවස විසූ මේ දෙළොස් මහා කවීන් අග්බෝ රජුගේ රාජ සභා කවීන් ද යනුත් සලකා බැලිය යුතු කරුණකි. ලක්දිව රජුන් සඳහා රාජසභා කවීන් වූ බවක් පැරණි තොරතුරුවලින් දත නො හැකිය. මෑත යුගවලදී එවැනි කවියන් සිටි බව නම් අසන්නට ලැබේ. ඈත අතීතයේ පටන් ම ඉන්දියාවේ නම් මේ සිරිත පැවති බව පෙනේ. සංස්කෘත සාහිත්‍යයේ පැනෙන බොහෝ ශ්‍රේෂ්ඨ කවීන් රාජසභා කවීන්ව සිටි බව පෙනේ. මහා කවි කාලිදාසයෝ ද එබන්දෙකි. මේ දඹදිව සිරිත නිසා හෝ ඒ පිළිබඳ ප්‍රවෘත්තිවල බලපෑම නිසා හෝ **පූජාවලිය** ප්‍රමුඛ ග්‍රන්ථ, දෙළොස් මහා කවියන් පිළිබඳ පුවත විශේෂයෙන් සඳහන් කළාද යනු සිතිය හැකිය. අග්බෝ රජුට ශතවර්ෂ දෙකකට පමණ පෙර ඉන්දියාවේ විසූ II වික්‍රමාදිත්‍ය චන්ද්‍රගුප්ත රජුට "නවරත්නය" නම් වූ රාජසභා කවීන් නම දෙනෙකු වූ බව පෙනේ. **පූජාවලියට** හා ඉන්පසු මෙම දෙළොස් මහාකවීන් ගැන සඳහන් කරන කෘතිවලට මේ පුවත ඇතුළුවීමේදී "ධන්වන්තරීක්ෂ පන කාමර සිංහ ශංකු" යන නවරත්නයන් පිළිබඳ සටහන එක්තරා ප්‍රමාණයක බලපෑමක් කරන්න ඇති බව සිතනු යෙදේ.

දෙළොස් මහාකවීන් ගැන මෙහි කී ඇතැම් කරුණු පරීක්ෂකයන්ගේ විමසුමට තව දුරටත් ලක්විය යුතු බව පවසනු කැමැත්තෙමු.

## පාදක සටහන්

1. **රාජාවලිය**, වතුවත්තේ පේමානන්ද හිමියන්ගේ සංස්කරණයේ 62 පිට සමඟ බී. ගුණසේකර සංස්කරණයේ 40 පිට සසඳා බලන්න.
2. **දළඳ සිරිත**, කුරුණෑගල යුගයේ රචිත ග්‍රන්ථයකි. **නිකාය සංග්‍රහය** රචනා කොට ඇත්තේ ඉන් අනතුරුව ගම්පොල සමයේදීය.
3. අදමලය රාජස්ස - දඨානාමං සයිතරං (243 පිට, ඌන පූරණ සහිතො මහාවංසො)
4. භාගි නෙය්‍යඤ්ච මලය - රාජඨානෙ ඨපෙසි සො (240 පිට).
5. උදාහරණ වශයෙන් සේන රජුගේ **සියබස්ලකරත්**, V කාශ්‍යපගේ **ධම්පියා අටුවා ගැටපදයත්** පැහැදිලි වශයෙන් අප හමුවට එයි. දඹදෙණි, කුරුණෑගල, කෝට්ටේ යුගයන්හි ග්‍රන්ථකරණයෙහි නියැලුණු රජවරු සිටියහ.
6. මාදලං උපරාජහෙත්ව-භාතරං යුවරාජකෙ.................. ඨපෙසි සො. (243 පිට. ඌන පූරණ සහිතො මහාවංසො)
7. **සැරය** - වෙල්ලාල ජයමහ (හඳුනවුව 92 පිට, 105 පිට).
8. **නිකාය සංග්‍රහය** (89 පිට, සමරනායක).
9. **සාහිත්‍යය**, 4 කලාපය, 13 පිට.
10. **අමාවතුර** කෝදාගොඩ ඥාණාලෝක සංස්කරණය, පිරියෙසිල් VIII පිට.
11. එව මාදීනං යන තැන්හි ආදි ශබ්දයෙන් දැමිසියන් දැමි ආදීන්ගේ තනතුරු ගැන කියත් **මහාබෝධිවංශ** ග්‍රන්ථිපද විවරණය, 45 පිට, ශ්‍රී ධර්මාරාම සැකැස්ම.)



12. (1) තමා වදනය පෙමින් නො ඉකතැයි හැංගේ.
    (2) i රතනදී ඉහිල් වසන තුරෙන් රසත්දම්
        ii කියව කර හරළා පැහැබර දිග නුවන් ලා මේ පාඨද්වය පොත් දෙකකින් උපුටාගත් වනැයි කුමාරතුංග මහතා **සිදත් විවරණයෙන්** පවසයි.
    (3) සක් කැබලිති සියො අගින් එක් පසක් යව්දිව්.
    (4) කුනු හොල වටහල යතලබ සතොස් සිත්තල.
13. I ජෝන් සිරිමන්ද සොයිසාගේ 'අසක්ද කව' නම් ලිපිය, සාහිත්‍යය 4 කලබ, 12-16 පිටු.
    II **ගී කවේ වගතුග** පොතේ 44-50 පිටු.
14. සාහිත්‍යය, 4 කලබ, 14 පිට.

# 62

# කිතුනු ජනවන්දනා නාට්‍යයේ පුර්තුගීසි ආභාසය හා ගරු ජාකුමේ ගොන්සාල්වේශ් පියතුමා සතු වූ හෙළ උරුමය

*මහාචාර්ය ඇම්.එච්. ගුණතිලක*

මා විසින් දර්ශනශූරී ආචාර්ය උපාධිය සඳහා 1974 වසරේ දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කරන ලදුව අනුමත වූ පර්යේෂණයට බඳුන් වූයේ **සිංහල හා දමිළ නාඩගම් කලාවේ පුර්තුගීසි ආභාසය** නම් වූ මාතෘකාවයි. මෙම අධ්‍යයනයේ පරීක්ෂකවරයා වූයේ මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන් ය. ඊට බොහෝ කලකට පෙර එනම් 1952 දී එතුමන් විසින් රචිත, "*The Folk Drama of Ceylon*" යන කෘතියෙන් සිංහල හා දමිළ නාඩගම් කලාව පිළිබඳ ව එතුමන් පුළුල් අධ්‍යයනයක නියැළී තිබේ (එම කෘතියේ 6වන පරිච්ඡේදය බලන්න). එතුමන් විසින් පසුකාලීන ව කරන්නට යෙදුණු පර්යේෂණවලට හසු වූ තවත් කරුණු රාශියක් සමග ඉංග්‍රීසි භාෂාවෙන් ලියැවුණු එම කෘතිය 1968 වසරේ දී **සිංහල ගැමි නාටකය** වශයෙන් සිංහල භාෂාවට පරිවර්තනය විය. එම කෘතියේ 8වන පරිච්ඡේදයේ "කවි නාඩගම්" වශයෙන් ද 10වන පරිච්ඡේදයේ "නාඩගම්" වශයෙන් ද සිංහල හා දමිළ නාඩගම් කලාව පිළිබඳ ව ඉතා පුළුල් අධ්‍යයනයක් දක්නට ලැබෙයි.

මා විසින් ඇරඹි පර්යේෂණයට එනම් සිංහල හා දමිළ නාඩගම් කලාවට බලපෑ පුර්තුගීසි ආභාසය සෙවීමේ දී කිතුනු ජනවන්දනා නාට්‍ය හා එහි පුර්තුගීසි ආභාසය ගැන කරුණු රාශියක් සොයාගනු ලැබීය. මෙම පර්යේෂණය සඳහා පුර්තුගීසි භාෂාව අධ්‍යයනය කොට එහි මූලාශ්‍ර නිවැරදි ව හඳුනාගන්නට මාහට හැකි විය. පුර්තුගාලයේ කුයිම්බ්‍රා හා ලිස්බෝ යන විශ්වවිද්‍යාලයන්හි 1960 සිට 1970 දක්වා වූ කාලය මේ සඳහා මම පූර්ණව කැප කළෙමි. මෙහි දී කිතුනු ජනවන්දනා නාට්‍යය පිළිබඳ වන පැරණි ම මූලාශ්‍ර හා අත් පිටපත් පරිශීලනය කරන්නට මට හැකි විය. එලෙස ම දේව ධර්මාචාර්ය අතිඋතුම් එඩ්මන් පීරිස් (නි.ම.නි.) රදගුරුතුමන්ගේ පුස්තකාලයෙන් **රජතුන් කට්ටුව** වැනි පැරණි නාඩගම් පිටපත් කිහිපයක් පරිශීලනය කරන්නටත් ඒවා පිළිබඳ ව එතුමන් සමග පුළුල් වශයෙන් සාකච්ඡා කරන්නටත් මට අවස්ථාව සැලසිණි. මීගමුව දූව ප්‍රදේශයේත් හලාවත, පුත්තලම හා දකුණු පළාතේ අම්බලන්ගොඩ, මාතර මෙන් ම උතුරු පළාතේ මන්නාරම් පේසාලේ හා



යාපනයේ එවකට ජීවතුන් අතර සිටි නාඩගම් රචකයන් මෙන් ම ඊට පෙර ලියූ නාඩගම් අත් පිටපත් බොහොමයක් මාහට අධ්‍යයනය කරන්නට වරම් ලැබුණි. මහාචාර්ය ඩී.ඊ. හෙට්ටිආරච්චි මහතාගේ පුස්තකාලයෙන් සමහර නාඩගම් පිටපත් සොයාගන්නට ද හැකි විය. ද්‍රවිඩ නාඩගම් සම්බන්ධයෙන් මට තොරතුරු ලබාදුන්නේ මහාචාර්ය සු. විත්තියානන්දන් හා ආචාර්ය සිවතම්බි යන මහත්වරුන් ය. සිංහල හා දමිළ නාඩගම් පිළිබඳ ව මා විසින් කළ මෙම පර්යේෂණයේ දී මා හඳුනාගත් ප්‍රධාන ලක්ෂණය වූයේ මෙරටට පැමිණි ක්‍රිස්තියානි ධර්මදූතයින්ගේ ධර්ම ප්‍රචාරක කටයුතු හා නාඩගම් පෙළ අතර දැඩි අන්‍යොන්‍ය සම්බන්ධයක් පැවතුණු බව යි.

විචාරාවලෝකනය ශාස්ත්‍රීය සඟරාවට ඉදිරිපත් කරන ලිපියෙන් මා තහවුරු කරන්නට උත්සාහ කරන්නේ සමස්ත කිතුනු ජන වන්දනා නාට්‍යයේ ම පුර්තුගීසි ආභාසය දිස් වන බැවින් සිංහල හා දමිළ නාඩගම් කලාව එහි එක් කොටසක් ලෙස මම සලකමි.

## කිතුනු ජනවන්දනා නාට්‍ය

ක්‍රිස්තියානි ජනවන්දනා නාට්‍යය ලෙස හඳුන්වනු ලබන්නේ ක්‍රිස්තියානි ධර්මය ප්‍රචාරය කරනු වස් යොදගන්නා ලද නාට්‍යමය ප්‍රභේදයකි. මෙහිලා මූලික වන්නේ පාස්කු නාට්‍ය, නත්තල් නාට්‍ය, සාන්තුවර චරිත මත රචනා වූ වෙනත් ආගමික නාට්‍ය, ආගමික පෙරහැර අනුසාරයෙන් වූ නාට්‍ය හා ධර්මදූත පූජකවරු පුහුණුව ලත් දෙව්සත්හල්වල පෙන්වූ නාට්‍යයන් ය. කිතුනු ජනවන්දනාව අයත් මෙම නාට්‍ය ප්‍රභේද සියල්ල ම ලාංකේය කිතුනු ජනවන්දනා නාට්‍ය පිළිබඳ ව වන ගවේෂණයේ දී දක්නට ලැබෙයි. එහෙත් මෙහි විශේෂත්වයක් වන්නේ ලාංකේය කිතුනු ජනවන්දනා නාට්‍යයේ මූලාශ්‍රය පිළිබඳ විමසා බැලීමේ දී ය. ලංකාවට කිතුනු ජනවන්දනා නාට්‍ය හඳුන්වා දුන්නේ වරින්වර දිවයිනට පැමිණි ධර්මදූත කාර්යයන්හි නියැලුණු ක්‍රිස්තියානි පූජකවරුන් විසිනි. ජේසු නිකායික හා ප්‍රැන්සිස්කානු නිකායික ධර්මදූතවරු මෙන්ම ශු. පිලිප්නේරි ධ්‍යාන පන්තියට අයත් ජාකුමේ ගොන්සාල්වේශ් වැනි ධර්මදූතවරු මෙහිලා කැපී පෙනෙති. ඔවුහු ඉන්දියාවේ කොරමැණ්ඩල් නම් වූ ධීවර වෙරළ (Coramandl Coast) ඔස්සේ ලංකාවට පිවිසුණහ. එසේ පැමිණි විට ඔවුහු දකුණු ඉන්දියාවේ විහිදී තිබූ ක්‍රිස්තියානි ජනවන්දනා රංග ක්‍රමය පිළිබඳ ව විශේෂ පුහුණුවක් ලබා සිටියහ. ක්‍රිස්තියානි රංග ක්‍රමය ඉන්දියාවට අවතීර්ණ වූයේ පුර්තුගීසි ජාතික ධර්මදූතයන්ගේ මාර්ගයෙනි. එම නිසා ලාංකේය කිතුනු ජනවන්දනා නාට්‍ය කෙසේ ද යන්න හඳුනාගැනීමට එහි මූලාශ්‍රය වන පුර්තුගීසි ක්‍රිස්තියානි ජනවන්දනා නාට්‍ය ප්‍රභේද විමසා බැලිය යුතුය.